# සිරපා වන්දනා කවි

පන්සාලිස් වසක් පුරා - දඹදිව් තලයේ වඩිනා
අපගේ සම්බුදු සමිඳුගේ - රන් වන් රන් සිරිපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

දහසක් නිම් වළලු පුරා - සක් ලකුණකි පිහිටා
රත් පැහැ පියුමක් විලසින් - බැබලුනි ඒ සිරිපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

සම ලෙස පොළොවේ පිහිටන - ඒ උත්තම සිරිපා
සසරේ දුලභය දිකිනට - බැබලෙන ඒ සිරපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

අටෝ රාසියක් ලකුණින් - විසිතුරු ඒ සිරපා
දික් වූ විලුඹින් යුතුවෙ යි - ඒ උත්තම සිරිපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

ලුම්බිණි සල් වනයේ දී - සත් පියවර තබනා
ඒ සිරිපා සිපගන්නට - සත් පියුමන් පිපුණා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

පිය රජිඳුගෙ ගුරු දෙවිඳුගේ - නළලත රැඳි සිරපා
පිය වැඳුමෙන් පිදුම් ලැබූ - සිගිති පුතුගෙ සිරිපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

සඳලුතලේ යශෝදරා - රහල් පුතුව ගෙන්වා
සුන්දර ගීයක් ගැයුවේ - ඒ සිරිපා පෙන්වා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

පිහිටා වැලි තලයේදී - අප මුනිඳුගෙ සිරිපා
නර්මදාවේ නා රජිඳුගෙ - විමනට වැඩි සිරිපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

මුදුන් සතක සම බිම මත - පිහිටන ලද සිරිපා
මහා පුරිස් ලකුණින් යුතු - බුදු සමිඳුගෙ සිරිපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

කතරක යෝනක පුරයේ - පිහිටා ඇති සිරිපා
අප ගෞතම මුනිඳුගේ ය - ඒ සුන්දර සිරිපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

මිණිකැට නෙත් නාරජිඳුගේ - විමනට වැඩි මුනිඳු
ගං පතුලේ නා විමනේ - මුනි සිරිපා තබනා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

සමනොල සිරසට වඩිනා - තිලොඅග බුදු සමිඳු
සිරිපා සළකුණ තබමින් - ලක් දෙරණින් වැඩියා
නළල බිම තබා වඳිනෙමු - අප මිනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

රන් දෙණ වැඩ සිටිනා විට - ඒ පින්බර සිරිපා
මහා කසුප් මුනිඳු සිරසෙ - අවසන් වර පිහිටා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

දෙව් නා සැම පුද දෙනවා - රන් වන් රන් සිරිපා
මනුලොව පුදනා සිරිපා - ලොවට සැපත සදනා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

සුවඳ පැන් පුද සතුටින් - වඳිනෙමු ඒ සිරිපා
මල් පහනින් විසිතුරු වෙයි - ඒ සුන්දර සිරපා
නළල බිම තබා වඳිනෙමු - දෙව් විමනේ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

සුවඳ පැන් පුද සතුටින් - වඳිනෙමු ඒ සිරිපා
මල් පහනින් විසිතුරු වෙයි - ඒ සුන්දර සිරපා
නළල බිම තබා වඳිනෙමු - නා විමනේ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

සුවඳ පැන් පුද සතුටින් - වඳිනෙමු ඒ සිරිපා
මල් පහනින් විසිතුරු වෙයි - ඒ සුන්දර සිරපා
නළල බිම තබා වඳිනෙමු - අප මුනිඳුගෙ සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා
සාදු සාදු අපිත් වඳිමු - ඒ සම්බුදු සිරිපා

සාදු! සාදු!! සාදු!!!